අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. : ED/03/53/02/15/VT(Gen)-2024

ඔබේ අංකය / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2024.06. 20

චක්‍රලේඛ අංක : 23/2024

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක පාසල්වල විදුහල්පතිවරුන්

**උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ගේ වෘත්තීය පුහුණුව පාසල් මඟින් නියාමනය අනිවාර්ය කිරීම.**

උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ (13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ) 13 ශ්‍රේණියේ සිසුන් වෘත්තීය පුහුණුවේ යෙදෙන මුළු කාලය තුළ (මධ්‍යස්ථානගත පුහුණුව හා රැකියාගත පුහුණුව/ ආධුනිකත්ව පුහුණුව) මසකට වරක් අදාළ ආයතනයට ගොස් සිසුන් පිළිබඳ පූර්ණ නියාමනයක් සිදු කිරීම පාසල්වල අනිවාර්ය වගකීමක් බව අවධාරණය කරමි

2. සිසුන් වෘත්තීය පුහුණුව ආරම්භ කිරීමට පෙර පාසල විසින් පහත කාර්යය සිදු කළ යුතු ය.

   i. අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ආදිය වෙත ගොස් ඒවා පාසල් සිසුන්ගේ පුහුණුව හා නවාතැන් ආදිය සඳහා සුදුසු බව තහවුරු කර ගැනීම.
   ii. සිසුන් වෘත්තීය පුහුණුවට ඇතුළත් කිරීමේ දී පාසලේ ගුරුවරයෙකු/ ගුරුවරියක සමඟ ඒ සඳහා යොමු කිරීම.

3. වෘත්තීය පුහුණුව ලබන සෑම සිසුවෙකු ම/ සිසුවියක ම ආවරණය වන පරිදි පාසලේ ගුරුවරයෙකු/ ගුරුවරියක විසින් මාසික ව අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට/ රැකියා ස්ථානයට ගොස් පහත කරුණු ආවරණය වන පරිදි පුහුණු කටයුතු ඇතුළු අදාළ සියලු අංශ නියාමනය කිරීම අනිවාර්ය බව සඳහන් කරමි.

   i. සිසුන්ගේ අධ්‍යයන ප්‍රගතිය සහ ශිෂ්‍ය වාර්තා පොත (Trainee's Progress Record Book) විධිමත් පරිදි පවත්වා ගැනීම.
   ii. සිසුන්ගේ දෛනික පැමිණීම.
   iii. ඇද හැලීමේ (Dropout) අවදානමක් සහිත සිසුන් හඳුනා ගැනීම.
   iv. සිසු සෞඛ්‍යාරක්ෂාව හා යහ පැවැත්ම නිසි පරිදි තහවුරු කර තිබීම.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister : +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary : +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk


CamScanner

v. ඉගෙනුම් පරිසරය ආරක්ෂිත වීම හා නේවාසිකාගාර නිසි තත්ත්වයේ පැවතීම.

vi. සිසුන්ගේ විනය, හැසිරීම හා සක්‍රිය සහභාගිත්වය පිළිබඳ උපදේශකවරුන්ගේ සහ මධ්‍යස්ථානයේ සෙසු නිලධාරීන්ගේ අදහස් ලබා ගැනීම.

4. මාසික නියාමනයේ දී සම්පූර්ණ කළ යුතු වාර්තාවේ ආකෘතිය ඇමුණුමෙහි දක්වා ඇත.

5. මාසික නියාමනයේ යෙදෙන ගුරුවරුන්ගේ පැමිණීමේ සහතික පාසලෙන් සකස් කර දී, අදාළ ආයතනය භාර නිලධාරියාගෙන් පැමිණීම තහවුරු කර ගත හැකි අතර. එම ගුරුවරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශ 26/2020 චක්‍රලේඛයට අනුව අදාළ දීමනා ලබා ගත හැකි ය.

6. මෙම චක්‍රලේඛයේ ඇතුළත් වගකීම් ඇතුළු මාසික නියාමන කටයුතු ගුරු භවතුන්ගේ කාලසටහනට ඇතුළත් කිරීම විදුහල්පතිගේ වගකීමකි.

7. පාසල් විසින් නියාමන කාලසටහන්, වාර්තා හා අදාළ තොරතුරු පවත්වා ගත යුතු ය.

8. පුහුණුවෙන් ඇද හැලීමේ (Dropout) අවදානමක් සහිත සිසුන් හඳුනාගෙන, ඔවුන්ට සුදුසු පරිදි උපදෙස් හා උපදේශනය ලබා දීමට ද, ඔවුන්ට අදාළ ගැටලු ආමන්ත්‍රණය කිරීමට ද, ඇද හැලීම් (Dropout) වළක්වා ගැනීමට ද අදාළ පාසල විසින් පියවර ගත යුතු ය.

9. සිසුන්ගේ පුහුණුව සම්බන්ධ ගැටලු වෘත්තීය විෂය ධාරාව සඳහා පත් කර ඇති වෘත්තීය පුහුණු ආයතනයේ සම්බන්ධීකාරක අමතා දැනුම්වත් කර, අවශ්‍ය අවස්ථාවල එම ගැටලු හා එම ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා පාසලේ නිර්දේශ, කලාප අධ්‍යාපන බලධාරීන්ට, පළාත් අධ්‍යාපන බලධාරීන්ට හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන්ට දැනුම් දිය යුතු ය.

Jayasundara

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් :

1. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
2. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
3. අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්

CamScanner

උ/පෙළ වෘත්තීය විෂය ධාරාව

(දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන)

**වෘත්තීය පුහුණුව - මාසික නියාමන වාර්තාව**

A. අදාළ වර්ෂය හා මාසය: ................................................

B. නියාමනය කළ දිනය: ................................................

C. නියාමන ගුරුවරයාගේ/ ගුරුවරියගේ නම: ................................................

D. නියාමනය කළ පුහුණු ආයතනය: ................................................

E. නියාමනය කළ මධ්‍යස්ථානය: ................................................

| 1. පාඨමාලාව | 2. පාඨමාලා ප්‍රගතිය (ඉතා හොඳයි, හොඳයි/ මධ්‍යස්ථයි/ සෑහීමකට පත් විය නොහැකියි) | 3. සිසුවාගේ නම | 4. සිසුවාගේ අධ්‍යයන ප්‍රගතිය (ඉතා හොඳයි, හොඳයි/ මධ්‍යස්ථයි/ සෑහීමකට පත් විය නොහැකියි) | 5. ශිෂ්‍ය වාර්තා පොත (නිසි පරිදි සම්පූර්ණ ය./ අසම්පූර්ණ ය.) | 6. පැමිණීම (> 80%/ 60% - 80%/ 40% - 60%/ 40% >) | 7. ඇද හැලීමේ අවදානම (අවදානමක් නැත/ මධ්‍යස්ථයි/ දැඩි ය) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

8. සිසු සෞඛ්‍යාරක්ෂාව හා යහපැවැත්ම

.......................................................................................................................................

.......................................................................................................................................

9. ඉගෙනුම් පරිසරයේ හා නේවාසිකාගාරවල තත්ත්වය

.......................................................................................................................................

.......................................................................................................................................

10. ආමන්ත්‍රණය විය යුතු ගැටළු හා ඒ පිළිබඳ ගත යුතු ඉදිරි පියවර

.......................................................................................................................................

.......................................................................................................................................

11. නිර්දේශ හා සංවර්ධන යෝජනා

.......................................................................................................................................

.......................................................................................................................................

12. වෙනත්

.......................................................................................................................................

.......................................................................................................................................

F. ගුරුවරයාගේ/ ගුරුවරියගේ අත්සන: ..................................................

G. දිනය: ..................................................



1

CamScanner